චතුරංග, සී.ඩී.-

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය

*Paper: Transformability*

# ග්‍රාමීය සිල්ලර වෙළෙඳසැල් හිමියන්ගේ ආදායම කෙරෙහි කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් (Mini Co-op City) වල බලපෑම

කුඩා සමූපකාර සුපිරි වෙළඳසැල් පිහිටුවීම නිසා ග්‍රාමීය සිල්ලර වෙළෙඳසැල් හිමියන්ගේ ආදායමට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට සිදුව ඇති බලපෑම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

මේ සඳහා බිංගිරිය සමූපකාර සමිතියට අයත් කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් දහය පිහිටුවා ඇති ප්‍රදේශ ආශ්‍රිත සිල්ලර වෙළෙඳසැල් 100 ක නියැදියක් සරල සසම්භාවී නියදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ දී ව්‍යුහගත ප්‍රශ්නාවලියක් සහිත සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගනු ලැබීය. රැස්කළ දත්ත විස්තරාත්මක සංඛ්‍යානය හා අනුමිතික සංඛ්‍යානය යොදාගනිමින් විශ්ලේෂණය කරන ලදී.

විශ්ලේෂිත දත්ත මඟින් නිරූපණය වූ පරිදි, කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් හිමියන්ගෙන් 83%ක් රු. 4000 කට වඩා අඩු ආදායම් උපයන නමුත් කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් පිහිටුවීමට පෙර ආදායම් තත්ත්ව සැලකීමේ දී එම ප්‍රතිශතය 41%කි. එම කුලකයට අයත් කුටුම්භ සංඛ්‍යාවෙන් 90% ක සාමාජිකයින් සංඛ්‍යාව 04 ට වැඩි ය. කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් වල සිට සිල්ලර වෙළෙඳසැල් වලට ඇති දුර හා සිල්ලර වෙළෙඳසැල් හිමියන්ගේ ආදායම යන විචල්‍යයන් දෙකෙහි ගුණිත පූර්ණ සහ සම්බන්ධතා සංගුණකය 0.8 කි. බිංගිරිය සමූපකාර සමිතියෙහි වාර්තාවන්ට අනුව පෙර වසර 05 තුළ කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් ඉපයූ ආදායම 135% කින් ඉහළ ගොස් තිබේ.

මෙම අධ්‍යයනයට අනුව කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල් පිහිටුවීම, ග්‍රාමීය සිල්ලර වෙළෙඳසැල් හිමියන් ප්‍රබල ආර්ථික පසුබෑමකට ලක්කිරීමට හේතු වී ඇත.

**මූල පද: - කුඩා සමූපකාර සුපිරි වෙළෙඳසැල්, සිල්ලර වෙළෙඳසැල්, ආදායම**